පැමිණෙන සංචාරකයින් සඳහා වැදගත් වන කරුණු

- 2021 මැයි 25 වැනි දින අවසානයට යාවත්කාලීන කෙරිණි.
- නවතම තොරතුරු සඳහා කරුණාකර යොමු වන්න: https://www.coronavirus.gov.hk/eng/inbound-travel.html

- පැමිණෙන සියලු සංචාරකයින් සෞඛ්‍ය ප්‍රකාශන ආකෘති පත්‍රය ඉදිරිපත් කළ යුතුය.
- “එන්නත් බුබුල” සංකල්පය යටතේ COVID-19 එන්නත් මාත්‍රා සම්පූර්ණ කර ඇති, හොංකොං වෙත පැමිණෙන (හොංකොං වෙත පැමිණෙන හොංකොං පදිංචිකරුවන් ද ඇතුළුව) පුද්ගලයින් සඳහා ගුවන් ගමන්, නිරෝධායන සහ පරීක්ෂණ කටයුතු රජය විසින් පිළියෙල කර ඇත. වැඩි විස්තර දැන ගැනීම සඳහා, මෙම සංක්ෂිප්ත මාර්ගෝපදේශය බලන්න:https://www.coronavirus.gov.hk/pdf/concise_guide_vaccinated_travellers_ENG.pdf
- නම් කරන ලද නිරෝධායන හෝටලය පිළිබඳ තොරතුරු දැන ගැනීම සඳහා කරුණාකර යොමු වන්න https://www.coronavirus.gov.hk/eng/designated-hotel.html

<u>හොංකොං වෙත පැමිණෙන පුද්ගලයෙකුට අදාළ වන ගුවන් ගමන් සහ නිරෝධායන විධිවිධාන රඳා පවතින්නේ:</u>

1. හොංකොං වෙත පැමිණෙන පුද්ගලයා හොංකොං වෙත ගුවන්ගත වන දින / හොංකොං වෙත පැමිණි දින හෝ එදිනට දින 21 කට පෙර රැඳී සිටි ස්ථාන මොනවාද ?

2. හොංකොං වෙත පැමිණෙන පුද්ගලයාට සම්පූර්ණයෙන්ම එන්නත ලබා දී තිබේද යන්න මතය.

- පුද්ගලයෙකු COVID-19 එන්නත් මාත්‍රා සම්පූර්ණ කළ 14 වන දින ගණනය කරනු ලබන්නේ COVID-19 එන්නතෙහි නිර්දේශිත මාත්‍රාව (මාත්‍රා) සියල්ල ලැබීමෙන් අනතුරුව, ඊළඟ දිනය පළමු දිනය සේ සලකා ය. උදාහරණයක් වශයෙන් මින් පෙර COVID-19 ආසාදනය වී නොමැති මෙන්ම, නිර්දේශිත COVID-19 එන්නත අවසන් වරට 2021 මැයි 10 වන දින ලබා ගත් පුද්ගලයෙකුට “පළමු දිනය” මැයි 11 වැනිදා වන අතර, “14 වන දිනය” 24 වැනිදා වේ. මැයි. මෙම පුද්ගලයා මැයි 24 වැනිදා සිට "එන්නත් මාත්‍රා සම්පූර්ණ කළේ" යැයි සැලකිය හැකිය.
- හොංකොං හි භාවිතය සඳහා දැනටමත් හඳුනාගෙන ඇති එන්නත්වලින් බැහැරව COVID-19 එන්නත් ලබා ගෙන හොංකොං වලින් පිටත ප්‍රදේශයක සිට පැමිණෙන පුද්ගලයින් සඳහා, මෙම ලැයිස්තුවට ඇතුළත් කර ඇති අනෙකුත් එන්නත් ද පිළිගනු ලැබේ: https://www.coronavirus.gov.hk/pdf/list_of_recognised_covid19_vaccines.pdf

<u>**හෝටල් කාමර වෙන් කිරීම සඳහා**, අදාළ ලේඛනවල පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුය:</u>

1. අදාළ සංචාරකයා හොංකොං වෙත පැමිණෙන දිනයේ සිට ඇරඹෙන අවශ්‍ය රාත්‍රී ගණනට නොඅඩු ප්‍රමාණයකට හොංකොං හි නම් කරන ලද නිරෝධායන හෝටලයක ඉංග්‍රීසි බසින් හෝ චීන බසින් කාමර වෙන් කිරීම තහවුරු කිරීම

<u>ගුවන් යානය පිටත්වීමට නියමිත වේලාවට පෙර පැය 72 ක් ඇතුළත සිදු කරන ලද COVID-19 **න්‍යෂ්ටික අම්ල පරීක්ෂණයක සෘණාත්මක ප්‍රතිඵල** තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන අදාළ ලේඛනවලට පහත සඳහන් දෑ ඇතුළත් විය යුතුය:</u>

1. රසායනාගාරයක් මගින් හෝ සෞඛ්‍ය සේවා ආයතනයක් විසින් අදාළ සංචාරකයාගේ නමට සමාන ඔහුගේ හෝ ඇයගේ වලංගු සංචාරක ලේඛනයේ දැක්වෙන පරිදි ඉංග්‍රීසි හෝ චීන භාෂාවෙන් නිකුත් කරන ලද පරීක්ෂණ වාර්තාවක්:

a. අදාළ සංචාරකයා COVID-19 සඳහා න්‍යෂ්ටික අම්ල පරීක්ෂණයකට භාජනය කරන ලද අතර, සාම්පල නියමිත ගුවන් යානයෙන් පිටත්වීමට නියමිත වේලාවට පැය 72 ක් ඇතුළත අදාළ සංචාරකයාගෙන් ලබා ගන්නා ලද ඒවා විය යුතුය;

b. සාම්පල මත සිදු කරන ලද පරීක්ෂණය COVID-19 සඳහා න්‍යෂ්ටික අම්ල පරීක්ෂණයකි; සහ

c. පරීක්ෂණයේ ප්‍රතිඵලය වන්නේ අදාළ සංචාරකයා COVID-19 සඳහා සෘණාත්මක වීමයි ; සහ

2. අදාළ වාර්තාව ඉංග්‍රීසි හෝ චීන භාෂාවෙන් නිකුත් කර නොමැති නම් හෝ ඉහත සියලු තොරතුරු අඩංගු නොවන්නේ නම්, රසායනාගාරය හෝ සෞඛ්‍ය සේවා ආයතනය විසින් අදාළ සංචාරකයාගේ වලංගු ගමන් බලපත්‍රයෙහි සඳහන් නමට සමාන ලෙස ඉංග්‍රීසි හෝ චීන භාෂාවෙන් ඉහත සියලු තොරතුරු ඇතුළත් කර නිකුත් කරන ලද තහවුරු කිරීමේ ලිපියක්. එකී ලිඛිත තහවුරු කිරීම පරීක්ෂණ වාර්තාව සමග ඉදිරිපත් කළ යුතුය; සහ

3. රසායනාගාරය හෝ සෞඛ්‍ය සේවා ආයතනය ISO 15189 සහතිකලත් හෝ එය පිහිටා ඇති රටෙහි රජයේ අධිකාරිය විසින් පිළිගෙන හෝ අනුමත කර ඇති ආයතනයක් බව පෙන්වීමට ඉංග්‍රීසි හෝ චීන භාෂාවෙන් ලේඛනගත සාක්ෂි; සහ

<u>එන්නත ලබාගත් අදාළ සංචාරකයා **එන්නත සම්බන්ධ** පහත ලේඛන ගත **සාක්ෂි** සැපයිය යුතුය:</u>

1. එන්නත ලබා දුන් ප්‍රදේශයේ සෞඛ්‍ය ආයතනයක් හෝ අදාළ රජයේ අධිකාරියක් විසින් අදාළ එන්නත් ලබා ගත් සංචාරකයා වෙත ඔහුගේ / ඇයගේ වලංගු ගමන් බලපත්‍රයේ නම දරන, ඉංග්‍රීසි හෝ චීන භාෂාවෙන් නිකුත් කරන ලද, පහත කරුණු දැක්වෙන එන්නත් කිරීමේ වාර්තාව :

   a. අදාළ සංචාරකයාට එන්නත් කරන ලද COVID-19 එන්නත මාත්‍රාව (මාත්‍රා) සහ එම මාත්‍රාව (මාත්‍රා) ලබා දුන් දින (ය); සහ

   b. ලබා දුන් එන්නතෙහි නම; සහ

2. අදාළ වාර්තාව ඉංග්‍රීසි හෝ චීන භාෂාවෙන් නිකුත් කර නොමැති නම් හෝ ඉහත සියලු තොරතුරු අඩංගු නොවන්නේ නම්, රසායනාගාරය හෝ සෞඛ්‍ය සේවා ආයතනය විසින් අදාළ සංචාරකයාගේ වලංගු ගමන් බලපත්‍රයෙහි සඳහන් නම දරන, ඉංග්‍රීසි හෝ චීන භාෂාවෙන් ඉහත සියලු තොරතුරු ඇතුළත් කර නිකුත් කරන ලද තහවුරු කිරීමේ ලිපියක්. එකී ලිඛිත තහවුරු කිරීම පරීක්ෂණ වාර්තාව සමග ඉදිරිපත් කළ යුතුය.

.